ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.03.04

පැමිණිලි පාර්ශවය : ඊ.එම්. විමලසේන මහතා,
හාතිගම්මන,
නිකවැරටිය.

වගඋත්තර පාර්ශවය : (1) ගුවන් හමුදාධිපති,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,
තැ.පෙ. 594, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ.

(2) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.

<u>පැමිණිලි අංකය : **HRC/835/24**</u>

**පැමිණිලි පාර්ශවයේ පැමිණිල්ල:**

පැමිණිලිකරු 2024.02.29 දිනැතිව තම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සඳහන් කර සිටින්නේ, තමා වසර 22ක කාලයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කර 2015.02.02 දින සිට විශ්‍රාම ලබාගත් බවත්, 2021 ජනවාරි මස 21 වන දින ගුවන් හමුදා විශ්‍රාම වැටුප්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අංශය විසින් තමා වෙත ලිපියක් යොමු කරමින් ට්‍රක් රථ එන්ජිමක් අස්ථානගත වීම සම්බන්ධව ගුවන් හමුදාව තුළ සිදුකරන ලද පරීක්ෂණයට අනුව තමා නාමාවලි භාරකරු ලෙස කටයුතු කිරීම හේතුවෙන් තමාගේ විශ්‍රාම වැටුපෙන් රු. 193,777.82ක මුදලක් අයකර ගැනීමට නිර්දේශ කර ඇති බවට දන්වන ලද බවත්, ගුවන් හමුදා නීති අංශය විසින් 2021 පෙබරවාරි මස 17 දිනැතිව එන්තරවාසියක් යොමු කරමින් රු. 193,777.82ක මුදල ගෙවීම් කරන ලෙසත් නැතහොත් සිවිල් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන බවට දන්වන ලද බවත්, අධිකරණ නියෝගයක් ලබා ගැනීමෙන් තොරව 2021 අප්‍රේල් මාසයේ සිට මාසිකව රු. 8500 බැගින් රු. 193,777.82ක මුදලක් තම විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති බවත් ය.

කරුණු එසේ තිබියදී තමාට කිසිදු දැනුම්දීමකින් තොරව 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට තම විශ්‍රාම වැටුපෙන් මාසිකව රු. 7030.68ක මුදලක් අය කර ගැනීම ආරම්භ කර ඇති බවත්, පසුව මේ සම්බන්ධයෙන් ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් අංශය වෙතින් විමසීම් සිදුකිරීමේදී ගුවන් හමුදාව විසින් සිදුකළ පූර්ව පරීක්ෂණ වාර්තාව නිවැරදි නොවීම හේතුවෙන් මාසිකව රු. 7030.68 බැගින් වාරික 40කින් රු. 281,227.17ක මුදලක් විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරන බවට දැන්වූ බවත්, මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, මාසිකව රු. 7030.68 බැගින් තම විශ්‍රාම වැටුපෙන් අය කරගැනීම පිළිබඳව මේ දක්වා කිසිදු ලිඛිත දැනුම්දීමක් සිදුකර නොමැති බවත් පැමිණිලිකරු සඳහන් කර සිටී.

තමා 2015.02.02 දින විශ්‍රාම ලබාගත් අවස්ථාවේදී නීත්‍යානුකූලව ගුවන් හමුදාවේ ක්‍රමවේදයන්ට අනුව සියලු නිශ්කාශන කටයුතු කර තිබියදී ගුවන් හමුදා පරීක්ෂණ අධිකරණය විසින් තමාට 2010 වර්ෂයේදී ගුවන් 5078 වාහනයේ එන්ජිමක් අස්ථානගත වීම සම්බන්ධයෙන් චෝදනා නගා තම විශ්‍රාම වැටුපෙන් මුදල් අය කර ගැනීමට පියවර ගැනීම තුළින් තමා අගතියට පත්ව ඇති බවත්, ඒ අනුව තමාට සාධාරණයක් සලසා දෙන ලෙස ඉල්ලා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම:**

පළමු වගඋත්තර පාර්ශවය වන ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2024.05.30 දිනැති අංක ශ්‍රීලංගුහ/ර.14231/පී3 දරණ වාර්තාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරමින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් ගුවන් 5078 දරණ රථයේ එන්ජිම ක්‍රියා විරහිත වීම හේතුවෙන් එම රථය 2010 වර්ෂයේදී ගුවන් හමුදාවෙන් පිටස්තර ආයතනයක් වන වීරසිංහ මෝටර්ස් නම් ආයතනයට ලබා දී තිබියදී අස්ථානගත වී ඇති අතර, එකී අස්ථානගත වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින්

සිදුකළ පරීක්ෂණ අධිකරණයේදී අනාවරණය වූ කරුණු අනුව අදාළ රථයේ එන්ජිම වීරසිංහ මෝටර්ස් ආයතනය වෙත ලබාදීමට කටයුතු කළ නිලධාරීන් එකී රථය වීරසිංහ මෝටර්ස් ආයතනය වෙත නියමිත කාර්ය පටිපාටියෙන් පරිබාහිරව ලබාදීම සිදුකර ඇත.

මෙම පැමිණිලිකරු වන 14231 බලලත් නිලධාරී ඊ.එම්. විමලසේන යන අය මෙම කාලවකවානුව තුළදී මෙම එන්ජිම අයත් නාමාවලි භාරකරු ලෙස කටයුතු කර ඇත. ගුවන් හමුදාව මගින් සිදු කළ නොහැකි ප්‍රධාන ගණයේ අලුත්වැඩියා කටයුතු පිටස්තර ආයතන වෙත යොමු කර අලුත්වැඩියා කිරීම සැපයුම් හා නඩත්තු ඩිපෝව හරහා සිදු කරනු ලබන අතර, එසේ භාරදීමෙන් අනතුරුව ඒ පිළිබඳ අවධානයෙන් සිට භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ප්‍රගතිය පිළිබඳව සොයා බැලීම අදාළ රථය හෝ භාණ්ඩ අයත් නාමාවලි භාරකරුගේ වගකීමක් වේ. නමුත් මෙම එන්ජිම පිටස්තර ආයතනයක් වෙත අලුත්වැඩියාව සඳහා යොමු කිරීම එවකට නිලධාරි අණ දෙන කාර්මික සේවා වශයෙන් කටයුතු කළ බලපත්‍රි ලුතිනන් ඩබ්.අයි. ද සිල්වා නිලධාරියාගේ අනුමැතිය මත සැපයුම් හා නඩත්තු ඩිපෝව දැනුවත් කිරීමෙන් තොරව සිදුකර ඇත. එසේම එන්ජිම අලුත්වැඩියාව සඳහා ලබා දුන් බව පැමිණිලිකරු වෙත දැනුම් දී ඇතත් ඔහු විසින් ඒ පිළිබඳව නිසි පරිදි කරුණු සොයා බැලීමක් සිදුකර නොමැති බවට පරීක්ෂණ අධිකරණයේදී අනාවරණය වී ඇත.

එකී පරීක්ෂණ අධිකරණයේදී තවදුරටත් අනාවරණය වී ඇත්තේ මෙම දෝෂ සහගත ගනුදෙනුව සඳහා මූලික වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා පුද්ගලයින් දෙදෙනෙකු වගකිව යුතු බවයි. ඒ අනුව සමස්ත අලාභ මුදලින් 60% එනම් රු. 290,659.24ක් බලපත්‍රි ලුතිනන් ඩබ්ලිව්.අයි. ද සිල්වාගෙන් ද රු. 193,772.82ක් එනම් මුළු මුදලින් 40% ක් බලලත් නිලධාරී ඊ.එම්. විමලසේන යන අයගෙන්ද අය කර ගත යුතු බවට නිර්දේශ විය. මෙම මුදල ගණනය කිරීම සිදුකොට ඇත්තේ ගුවන් 5078 දරණ රථය 2005 වර්ෂයේදී මිලදී ගත් රු.1,550,000ක මුදල සහ පරීක්ෂණ අධිකරණය පැවැත්වූ අවස්ථාවේ, එනම් 2018 වර්ෂයේදී එන්ජින් උපාංගවල මිල ගණන් 2005 වර්ෂයට සාපේක්ෂව ඉහළ යාම පදනම් කොටගෙන වන අතර, ඒ අනුව මෙම අස්ථානගත වූ එන්ජිමේ දළ හෝ තක්සේරු පිරිවැය රු. 484,432.06ක මුදලක් ලෙස තීරණය වී ඇති අතර, එම මුදලින් 60% සහ 40% ලෙස අයකර ගත යුතු මුදල් අදාළ සේවා පුද්ගලයින්ගෙන් මෙම අස්ථානගත වීම සඳහා වගකීමේ ප්‍රමාණයට සාපේක්ෂව බෙදා දැක්වීම සිදුකර ඇත.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ රෙගුලාසි අංක 12(1) ප්‍රකාරව යම් විශ්‍රාමික සේවා පුද්ගලයෙකුගේ විශ්‍රාම වැටුප මගින් රජයට අය කර ගත යුතු අය කිරීම් සම්බන්ධව නීතිමය ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව, මෙහිදී පැමිණිලිකරු ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් නීත්‍යානුකූලව විශ්‍රාම ගෙන තිබූ බැවින් පැමිණිලිකරුගෙන් අයවිය යුතු ලෙස නිර්දේශ වූ රු.193,772.82ක මුදල අයකර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත යොමු කරන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් අනතුරුව 2021 අප්‍රේල් මස සිට 2022 ජනවාරි මස දක්වා මාසිකව රු. 8500 බැගින් අයකර ගැනීම සිදු කර ඇත. කෙසේ නමුත් මෙම

අය කර ගැනීම සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කිරීමට ගුවන් හමුදාව කටයුතු කළ අවස්ථාවේදී එම අමාත්‍යාංශය විසින් දන්වා ඇත්තේ, සන්නද්ධ හමුදාවල නැතිවීම් පිළිබඳ 102 වැනි මුදල් රෙගුලාසියේ දෙවන සටහන අනුව සකස් කළ විශේෂ නීති සංග්‍රහයේ 08 වගන්තිය අනුව නැතිවූ භාණ්ඩයක් වෙනුවට අලුත් භාණ්ඩයක් සැපයීමට වැයවන පිරිවැය හා එහි දෙපාර්තමේන්තු ගාස්තුවද ඇතුළත් විය යුතු බැවින් අයකර ගත යුතු මුළු වටිනාකම රු.1,187,500ක් ලෙස සංශෝධනය විය යුතු බවයි. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත අදාළ අයකර ගත යුතු මුදල සංශෝධනය කිරීම සිදුකළ බවත්, ඒ අනුව සමස්ත මුදලින් රු.475,000ක මුදලක් බලලත් නිලධාරී ඊ.එම්. විමලසේන යන අයගෙන් අය කර ගත යුතු වූ බව දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරුගෙන් මුල් අවස්ථාවේදී අයකර ගන්නා ලද මුදලට අමතරව රු.281,227.17ක මුදලක් තවදුරටත් ඔහුගෙන් අය විය යුතු බැවින් එම මුදල අයකර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත යොමු කරන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් 2023 මාර්තු මස 7 වන දින යොමු කර ඇති බවත්, ඒ අනුව එම අය කර ගැනීම ක්‍රියාත්මක වී ඇති බවත් දක්වා ඇත.

ඉහත ක්‍රමවේදයන්ට අනුව නීත්‍යානුකූලව මෙම අය කිරීම සිදුකර ඇති බවත්, ඉහත කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය කරන සියලු ලිපි ලේඛන ගුවන් හමුදාව සතුව පවතින බවත්, මෙම අයකර ගැනීම් ක්‍රියාවලිය තුළ ගුවන් හමුදාව කටයුතු කර ඇති නීත්‍යානුකූල ක්‍රමවේදයන් ප්‍රකාර පැමිණිලිකරුගේ මානව හිමිකම් කිසිවක් කඩවීමට හේතු උද්ගත වී නොමැති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු:**

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණ කටයුතු 2025.07.22, 2025.10.21 සහ 2025.12.18 යන දිනවල පැමිණිලිකරුගේ සහ ගුවන් හමුදාපති නියෝජනය කරමින් සහභාගී වූ නීති නිලධාරී එච්.පී.කේ.ටී.පී. දහනායක මහතාගේ සහභාගීත්වයෙන් යුතුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී සිදුකරන ලදී.

මෙම එන්ජිම අස්ථානගත වී ඇති බවට වගඋත්තර පාර්ශවය සඳහන් කරන 2010 වර්ෂයේදී තමා කටුනායක කඳවුරෙහි සේවය කළ නමුත් 2011 ජනවාරි මාසයේදී ස්ථානමාරු ලබා තමා වෙනත් ස්ථානයක රාජකාරී සඳහා වාර්තා කළ බවත්, එම අවස්ථාවේදී තමා වෙනුවට එම ස්ථානයේ රාජකාරි සඳහා පැමිණි විජේරත්න නැමැති නිලධාරියා වෙත පැමිණිලිකරු විසින් තමාගේ රාජකාරි, වගකීම්, රෙජිස්ටර්, ඇණවුම් පෝරම සහ 100% පරීක්ෂා කළ තොග සුදුසු තත්ත්වයෙන් භාරදුන් බවට ලේඛන මඟින් තහවුරු වන බවත්, එකී ලේඛනයේ විජේරත්න නැමැති නිලධාරියා විසින් 2011.02.08 දිනැතිව අත්සන් තබා භාණ්ඩ භාරගැනීම සිදුකර ඇති බවත්, පැමිණිලිකරුගේ ඍජු අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කළ පී. බී. ලියනගේ යන අය ද 2011.02.08 දිනැතිව එම ලේඛනයේ අත්සන් තබා ඇති බවත්, පැමිණිලිකරු විසින් අදාළ ලේඛනයේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින්

කරුණු ඉදිරිපත් කරන ලදී. කෙසේනමුත් වගඋත්තර පාර්ශවය විසින් සඳහන් කර සිටියේ, පැමිණිලිකරු විසින් භාණ්ඩ භාරදීම සිදු කර ඇති නමුත් අභ්‍යන්තර පරීක්ෂණයේදී හෙලිවී ඇති කරුණු වලට අනුව ගුවන් 5078 දරණ රථයේ එන්ජිම එම අවස්ථාව වන විට තිබී නොමැති බවට පරීක්ෂණ අධිකරණ වාර්තා අනුව නිරීක්ෂණය වන බවයි.

තවද කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණය අවස්ථාවේදී පැමිණිලිකරු සඳහන් කර සිටියේ, ප්‍රශ්නගත සිදුවීමට අදාළව ගුවන් හමුදාව විසින් සිදුකළ පරීක්ෂණ අධිකරණයේදී තමාගේ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලද බවත්, ඒ අනුව කිසිදු කරුණු විමසීමකින් තොරව පරීක්ෂණ අධිකරණය විසින් තීරණයක් ලබා දී ඇති බවත් ය. මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් ගුවන් හමුදාධිපති නියෝජනය කරමින් පරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වූ නීති නිලධාරී එච්.පී.කේ.ටී.පී. දහනායක මහතා සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා ඒකල ගුවන් හමුදා කඳවුර වෙත වාර්තා කරන ලෙස පොලිස් පණිවිඩයක් මගින් දැනුම්දී ඇති බවත්, ඊට අමතරව ගුවන් හමුදා නිලධාරීන් යොදවා පැමිණිලිකරු පදිංචි ස්ථානය වෙත පණිවිඩයක් ලබාදීමට කටයුතු කර ඇති නමුත් පැමිණිලිකරු විදේශ රැකියාවක් සඳහා පදිංචි ලිපිනය හැරගොස් ඇති බවට ග්‍රාම නිලධාරීවරයා විසින් ගුවන් හමුදා පොලිසියේ නිලධාරින් වෙත දැනුම් දුන් බවට පරීක්ෂණ අධිකරණයේ ලේඛන පරීක්ෂා කිරීමේදි පෙනී යන බවයි. ඊට පිළිතුරු වශයෙන් පැමිණිලිකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ තමා විශ්‍රාම යාමෙන් අනතුරුව දැඩි ආර්ථික අපහසුතා හේතුවෙන් සමුද්‍ර ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් වෙළඳ නෞකාවල සේවයට එක්වූ බවත්, තමා නිවසින් බැහැරව සේවයට ගොස් සිටියදී 2020.09.03 දින නිකවැරටිය පොලිස් ස්ථානය මගින් පණිවිඩ පෝරමයක් ලබාදෙමින් 2020.09.04 දින ඒකල ගුවන් හමුදාවේ කඳවුරේ පැවැත්වෙන පරීක්ෂණය සඳහා සහභාගී වන ලෙස දන්වා තිබූ නමුත් එම පණිවිඩ පෝරමයේ තමාගේ ගුවන් හමුදා සේවා අංකය වැරදි ලෙස සඳහන් කර තිබූ බවත් ය. තවද තමා සමුද්‍ර රාජකාරියේ යෙදෙන බැවින් එම පරීක්ෂණය සඳහා සහභාගී වීමේ කිසිදු හැකියාවක් නොවූ බවත්, අදාළ පරීක්ෂණය සඳහා තමා කැඳවූ දිනයේදී තමා විදේශ ගතව සිටි බවට තම ගුවන් ගමන් බලපත්‍රය මගින් තහවුරු කර ගැනීමේ හැකියාව පවතින බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අදාළ එන්ජිම අස්ථානගත වීම සම්බන්ධයෙන් මෙම පැමිණිලිකරුගෙන් සහ වගකිව යුතු අනෙක් නිළධාරියා වන ඩබ්ලිව්.අයි.ද සිල්වා යන අයගෙන් අලාභය අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරන ලෙසට ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගරු නීතිපතිවරයා වෙත දැනුම්දීමට කටයුතු කරන ලද බවත්, එහිදී මෙම පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් අදාළ අලාභයන් අයකර ගැනීමට කටයුතු කරන බැවින් නඩු පැවරීම විෂයෙහි කටයුතු කළ නොහැකි බව දැනුම්දී ඇති බවත් වගඋත්තර පාර්ශවය පරීක්ෂණය අවස්ථාවේදී සඳහන් කරන ලදී. ඩබ්ලිව්.අයි.ද සිල්වා නිලධාරියා විදේශගතව සිටින බවට අනාවරණය වී ඇති බැවින් ඔහුට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අවශ්‍ය පියවර ගෙන ඇති

බවත්, පැමිණිලිකරු සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ අධිකරණයේ නිර්දේශ ප්‍රකාරව පවත්නා ගුවන් හමුදා නිති, රෙගුලාසි හා අනෙකුත් නියෝගවලට අනුකූලව ගුවන් හමුදාව පැමිණිලිකරු සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

පැමිණිලිකරු 2015.02.02 දින විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සාමාන්‍ය ක්‍රමවේදයට අනුව විශ්‍රාම ගන්වා තිබියදී, 2010 වර්ෂයේදී අස්ථානගත වූ එන්ජිමක් සම්බන්ධයෙන් 2020 වර්ෂයේදී, එනම් පැමිණිලිකරු විශ්‍රාම යාමෙන් වසර 5කට පසුව ගුවන් හමුදා පරීක්ෂණ අධිකරණයක් පවත්වා, පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම ගැටළුකාරී බවට පරීක්ෂණය අවස්ථාවේදී නිරීක්ෂණය වූ බැවින් මෙම කාරණය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් වාර්තාවක් කැඳවීම සිදුකරන ලදී.

ඒ අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති 2025.08.27 දිනැති අංක පීඑන්/4003ඊ/එච්ආර්සී/2025/62 දරණ වාර්තාව මඟින් සහ 2025.12.18 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණයේදී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් පරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වූ නීති නිලධාරිනී එම්.ඒ.එච්.එස්.ඩී.සේනාසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ.

- පැමිණිලිකරු වසර 22 ක සේවා කාලයකින් පසුව 2015.02.02 දින විශ්‍රාම ගොස් ඇත. ඔහු දැනට නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා අතර, මොහු ගුවන් හමුදාවේ සේවයේ යෙදී සිටි කාල සීමාව තුළ සිදු වූ ට්‍රක් රථ එංජිමක් අස්ථානගත වීම සම්බන්ධව සිදු කරන ලද පරීක්ෂණයෙන් අනතුරුව මෙම පැමිණිලිකරුගෙන් රු.193,772.82 ක මුදලක් නැවත ගුවන් හමුදාවට අයවිය යුතු බවත්, එම අය විය යුතු මුදල මෙම අයගේ විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අය කර ගුවන් හමුදාව වෙත එවීමට කටයුතු කරන ලෙසත් අංක ශ්‍රී ලංලංගුහ/283/1/4 ගිණුම් හා 2021.01.20 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇත. ඒ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එම මුදල 2021 මාර්තු මස සිට අයකර යවා ඇත. ඉන් අනතුරුව ශ්‍රී ලංගුහ/283/1/4/ ගිණුම් හා 2023.03.07 දිනැති ලිපිය මඟින් තවදුරටත් මෙම පැමිණිලිකරුගෙන් රු.281,227.17 ක මුදලක් අයවිය යුතු බවට දැනුම්දීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එම මුදල 2023 සැප්තැම්බර් මස සිට අයකර ගැනීමට කටයුතු කර ඇත.

- 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ 28 වන වගන්තිය මඟින් යම් නිලධරයකුගෙන් හෝ ගුවන් භටයෙකුගෙන් රජයට නැතහොත් සේවා ණය සහන සභාවට හෝ අය විය යුතුව තිබෙන යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණයන් එම නිලධරයා හෝ

ගුවන් භටයා වෙනුවෙන් ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුපකින් හෝ පාරිතෝෂිකයකින් අඩුකර ගත හැකි බව කරුණු දක්වා ඇති බව වැඩිදුරටත් දන්වා ඇත.

**නිරීක්ෂණ:**

පැමිණිලිකරු 2024.02.29 දිනැතිව තම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා වසර 22ක කාලයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කර 2015.02.02 දින සිට විශ්‍රාම ලබාගත් බවත්, 2021 ජනවාරි මස 21 වන දින ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශය විසින් තමා වෙත ලිපියක් යොමු කරමින් ට්‍රක් රථ එන්ජිමක් අස්ථානගත වීම සම්බන්ධව ගුවන් හමුදාව තුළ සිදුකරන ලද පරීක්ෂණයට අනුව තමා නාමාවලි භාරකරු ලෙස කටයුතු කිරීම හේතුවෙන් තමාගේ විශ්‍රාම වැටුපෙන් රු. 193,777.82ක මුදලක් අයකර ගැනීමට නිර්දේශ කර ඇති බවට දන්වන ලද බවත්, ගුවන් හමුදා නීති අංශය විසින් 2021 පෙබරවාරි මස 17 දිනැතිව එන්තරවාසියක් යොමු කරමින් රු. 193,777.82ක මුදල ගෙවීම් කරන ලෙසත් නැතහොත් සිවිල් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන බවට දන්වන ලද බවත්, අධිකරණ නියෝගයක් ලබා ගැනීමෙන් තොරව 2021 අප්‍රේල් මාසයේ සිට මාසිකව රු. 8500 බැගින් රු. 193,777.82ක මුදලක් තම විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති බවත් ය.

කරුණු එසේ තිබියදී තමාට කිසිදු දැනුම්දීමකින් තොරව 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට තම විශ්‍රාම වැටුපෙන් මාසිකව රු. 7030.68ක මුදලක් අය කර ගැනීම ආරම්භ කර ඇති බවත්, පසුව මේ සම්බන්ධයෙන් ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් අංශය වෙතින් විමසීම් සිදුකිරීමේදී ගුවන් හමුදාව විසින් සිදුකළ පූර්ව පරීක්ෂණ වාර්තාව නිවැරදි නොවීම හේතුවෙන් මාසිකව රු. 7030.68 බැගින් වාරික 40කින් රු. 281,227.17ක මුදලක් විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරන බවට දැන්වූ බවත්, මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, මාසිකව රු. 7030.68 බැගින් තම විශ්‍රාම වැටුපෙන් අය කරගැනීම පිළිබඳව මේ දක්වා කිසිදු ලිඛිත දැනුම්දීමක් සිදුකර නොමැති බවත් පැමිණිලිකරු සඳහන් කර සිටී.

තමා 2015.02.02 දින විශ්‍රාම ලබාගත් අවස්ථාවේදී නීත්‍යානුකූලව ගුවන් හමුදාවේ ක්‍රමවේදයන්ට අනුව සියලු නිශ්කාශන කටයුතු කර තිබියදී ගුවන් හමුදා පරීක්ෂණ අධිකරණය විසින් තමාට 2010 වර්ෂයේදී ගුවන් 5078 වාහනයේ එන්ජිමක් අස්ථානගත වීම සම්බන්ධයෙන් චෝදනා නගා තම විශ්‍රාම වැටුපෙන් මුදල් අය කර ගැනීමට පියවර ගැනීම තුළින් තමා අගතියට පත්ව ඇති බවත්, ඒ අනුව තමාට සාධාරණයක් සලසා දෙන ලෙස ඉල්ලා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණුවලට අනුව, ගුවන් 5078 වාහනයේ එන්ජිමක් අස්ථානගත වීම සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ අධිකරණයේදී නිර්දේශ වී ඇත්තේ, අස්ථානගත වූ එන්ජිම සම්බන්ධයෙන් සමස්ත අලාභ මුදලින් 60% එනම් රු.290,659.24ක් බලපත්‍රිත ලුතිනන් ඩබ්ලිව්.අයි. ද සිල්වාගෙන් ද, රු. 193,772.82ක් එනම් මුළු මුදලින් 40% ක් බලලත් නිලධාරී ඊ.එම්. විමලසේන යන අයගෙන්ද අය කර ගත යුතු බවයි. මෙම මුදල ගණනය කිරීම සිදුකොට ඇත්තේ ගුවන් 5078 දරණ රථය 2005 වර්ෂයේදී මිලදී ගත් රු.1,550,000ක මුදල සහ පරීක්‍ෂණ අධිකරණය පැවැත්වූ අවස්ථාවේ, එනම් 2018 වර්ෂයේදී එන්ජින් උපාංගවල මිල ගණන් 2005 වර්ෂයට සාපේක්ෂව ඉහළ යාම පදනම් කොටගෙන වන බැවින් මෙම අස්ථානගත වූ එන්ජිමේ දළ හෝ තක්සේරු පිරිවැය රු.484,432.06ක මුදලක් ලෙස තීරණය වී ඇති අතර, එම මුදලින් 60% සහ 40% ලෙස අයකර ගත යුතු මුදල් අදාළ සේවා පුද්ගලයින්ගෙන් මෙම අස්ථානගත වීම සඳහා වගකීමේ ප්‍රමාණයට සාපේක්ෂව බෙදා දැක්වීම සිදුකර ඇත.

කෙසේනමුත්, පැමිණිලිකරු ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් නීත්‍යානුකූලව විශ්‍රාම ගෙන තිබූ බැවින් පැමිණිලිකරුගෙන් අයවිය යුතු ලෙස නිර්දේශ වූ රු.193,772.82ක මුදල අයකර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත යොමු කරන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් අනතුරුව 2021 අප්‍රේල් මස සිට මාසිකව රු.8500 බැගින් අයකර ගැනීම සිදු කර ඇත.

කෙසේ නමුත් මෙම අයකර ගැනීම සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කිරීමට ගුවන් හමුදාව කටයුතු කළ අවස්ථාවේදී එම අමාත්‍යාංශය විසින් දන්වා ඇත්තේ, සන්නද්ධ හමුදාවල නැතිවීම් පිළිබඳ 102 වැනි මුදල් රෙගුලාසියේ දෙවන සටහන අනුව සකස් කළ විශේෂ නීති සංග්‍රහයේ 08 වගන්තිය අනුව නැතිවූ භාණ්ඩයක් වෙනුවට අලුත් භාණ්ඩයක් සැපයීමට වැයවන පිරිවැය හා එහි දෙපාර්තමේන්තු ගාස්තුවද ඇතුළත් විය යුතු බැවින් අයකර ගත යුතු මුළු වටිනාකම රු.1,187,500ක් ලෙස සංශෝධනය විය යුතු බවයි. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත අයකර ගත යුතු මුදල සංශෝධනය කිරීම සිදුකළ බවත්, ඒ අනුව සමස්ත මුදලින් රු.475,000ක මුදලක් බලලත් නිලධාරී ඊ.එම්. විමලසේන යන අයගෙන් අයකර ගත යුතු වූ බවත් ය.

ඒ අනුව පැමිණිලිකරුගෙන් මුල් අවස්ථාවේදී අය කර ගන්නා ලද මුදලට අමතරව රු.281,227.17ක මුදලක් තවදුරටත් ඔහුගෙන් අය විය යුතු බැවින් එම මුදල අයකර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත යොමු කරන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් 2023 මාර්තු මස 7 වන දින යොමු කර ඇති අතර, ඒ අනුව එම අය කර ගැනීම ක්‍රියාත්මක වී ඇත.

වගඋත්තර පාර්ශවය විසින් පරීක්ෂණය අවස්ථාවේදී සඳහන් කර සිටියේ, පැමිණිලිකරු විසින් ලිඛිතව භාණ්ඩ භාරදීම සිදු කර ඇති නමුත් අභ්‍යන්තර පරීක්ෂණයේදී හෙළිවී ඇති කරුණු වලට අනුව ගුවන් 5078 දරණ රථයේ එන්ජිම එම අවස්ථාව වන විට සත්‍ය වශයෙන්ම තිබී නොමැති බවට පරීක්ෂණ

අධිකරණ වාර්තා අනුව නිරීක්ෂණය වන බවයි. මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත්තේ, මෙම එන්ජිම අස්ථානගත වී ඇති බවට වගඋත්තර පාර්ශවය සඳහන් කරන 2010 වර්ෂයේදී පැමිණිලිකරු කටුනායක කඳවුරෙහි සේවය කළ නමුත් 2011 ජනවාරි මාසයේදී ස්ථානමාරු ලබා තමා වෙනත් ස්ථානයක රාජකාරි සඳහා වාර්තා කර ඇති බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරු වෙනුවට එම ස්ථානයේ රාජකාරි සඳහා පැමිණි විජේරත්න නැමැති නිලධාරියා වෙත පැමිණිලිකරු විසින් තමාගේ රාජකාරි, වගකීම්, රෙජිස්ටර්, ඇණවුම් පෝරම සහ 100% පරීක්ෂා කළ තොග සුදුසු තත්ත්වයෙන් භාරදුන් බවට ලේඛන මඟින් තහවුරු වන බවත්, එකී ලේඛනයේ විජේරත්න නැමැති නිලධාරියා විසින් 2011.02.08 දිනැතිව අත්සන් තබා භාණ්ඩ භාරගැනීම සිදුකර ඇති බවත්, පැමිණිලිකරුගේ සෘජු අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කළ පී. බී. ලියනගේ යන අය ද 2011.02.08 දිනැතිව එම ලේඛනයේ අත්සන් තබා ඇති බවත් ය. ඒ අනුව පැමිණිලිකරු විධිමත් ලෙස අදාළ භාණ්ඩ භාර දී වෙනත් අංශයකට ස්ථාන මාරු වී, විශ්‍රාම යාමෙන් වසර 5ක් ගතවීමෙන් පසුව ගුවන් 5078 දරණ රථයේ එන්ජිම අස්ථානගත වීම සම්බන්ධයෙන් චෝදනා නැගීම පිළිගත නොහැකි බවට නිරීක්ෂණය වේ.

තවද කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණය අවස්ථාවේදී පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, ප්‍රශ්නගත සිදුවීමට අදාළව ගුවන් හමුදාව විසින් සිදුකළ පරීක්ෂණ අධිකරණයේදී තමාගේ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලද බවත්, ඒ අනුව කිසිදු කරුණු විමසීමකින් තොරව පරීක්ෂණ අධිකරණය විසින් තීරණයක් ලබා දී ඇති බවත් ය.

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් ගුවන් හමුදාධිපති නියෝජනය කරමින් පරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වූ නීති නිලධාරී එච්.පී.කේ.ටී.පී. දහනායක මහතා සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා ඒකල ගුවන් හමුදා කඳවුර වෙත වාර්තා කරන ලෙස පොලිස් පණිවිඩයක් මගින් දැනුම්දී ඇති බවත්, ඊට අමතරව ගුවන් හමුදා නිලධාරීන් යොදවා පැමිණිලිකරු පදිංචි ස්ථානය වෙත පණිවිඩයක් ලබාදීමට කටයුතු කර ඇති නමුත් පැමිණිලිකරු විදේශ රැකියාවක් සඳහා පදිංචි ලිපිනය හැරගොස් ඇති බවට ග්‍රාම නිලධාරීවරයා විසින් ගුවන් හමුදා පොලිසියේ නිලධාරීන් වෙත දැනුම් දුන් බවට පරීක්ෂණ අධිකරණයේ ලේඛන පරීක්ෂා කිරීමේදි පෙනී යන බවයි.

ඊට පිළිතුරු වශයෙන් පැමිණිලිකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ තමා විශ්‍රාම යාමෙන් අනතුරුව දැඩි ආර්ථික අපහසුතා හේතුවෙන් සමුද්‍ර ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් වෙළඳ නෞකාවල සේවයට එක්වූ බවත්, තමා නිවසින් බැහැරව සේවයට ගොස් සිටියදී 2020.09.03 දින නිකවැරටිය පොලිස් ස්ථානය මඟින් පණිවිඩ පෝරමයක් ලබාදෙමින් 2020.09.04 දින ඒකල ගුවන් හමුදාවේ කඳවුරේ පැවැත්වෙන පරීක්ෂණය සඳහා සහභාගී වන ලෙස දන්වා තිබූ නමුත් එම පණිවිඩ පෝරමයේ තමාගේ ගුවන් හමුදා සේවා අංකය වැරදි ලෙස සඳහන් කර තිබූ බවත් ය. තවද තමා සමුද්‍ර රාජකාරියේ යෙදෙන බැවින් එම පරීක්ෂණය සඳහා සහභාගී වීමේ කිසිදු හැකියාවක් නොවූ බවත්, අදාළ පරීක්ෂණය සඳහා

තමා කැඳවූ දිනයේදී තමා විදේශ ගතව සිටි බවට තම ගුවන් ගමන් බලපත්‍රය මඟින් තහවුරු කර ගැනීමේ හැකියාව පවතින බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව, පැමිණිලිකරු විශ්‍රාම යාමෙන් වසර 5කට පසුව පැවැත්වූ මෙම පරීක්ෂණයේදී පැමිණිලිකරුට තමාගේ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබීම තුළ ඔහු අගතියට පත්ව ඇති බව නිරීක්ෂණය වන අතර, එකී පරීක්ෂණය ඔහු විශ්‍රාම යාමෙන් දීර්ඝ කාලයකට පසුව පැවැත්වෙන බැවින් පළමු වගඋත්තරකාර පාර්ශවය විසින් අදාළ පරීක්ෂණය සම්බන්ධයෙන් පැමිණිලිකරු හට විධිමත් පරිදි දැනුම්දීමක් සිදුවූ බවට තහවුරු කර ගැනීමෙන් පසුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කළ යුතුව තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

එමෙන්ම පැමිණිලිකරු විශ්‍රාම යාමෙන් වසර 5කට පමණ පසුව ගුවන් හමුදාව විසින් අදාළ පරීක්ෂණය පවත්වා ගුවන් 5078 දරණ රථයේ එන්ජිම අස්ථානගත වීම සම්බන්ධයෙන් මෙම පැමිණිලිකරුගෙන් සහ වගකිව යුතු අනෙක් නිළධාරියා වන ඩබ්ලිව්.අයි.ද සිල්වා යන අයගෙන් අලාභය අයකර ගැනීම සඳහා තීරණය වී ඇති අතර, ගුවන් හමුදා නීති අංශය විසින් පැමිණිලිකරු වෙත 2021 පෙබරවාරි මස 17 දිනැතිව එන්තරවාසියක් යොමු කරමින් රු. 193,777.82ක මුදල ගෙවීම් කරන ලෙසත් නැතහොත් සිවිල් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන බවත් දන්වා ඇති පසුබිමක, ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමකින් තොරව පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. එලෙස පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අය කරමින් තිබියදී පැමිණිලිකරුගෙන් අයවිය යුතු මුදල සඳහා ඔහුට එරෙහිව නඩු පවරන ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නීතිපතිවරයා වෙත දැනුම්දීමට කටයුතු කර ඇති නමුත් මෙම පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් අදාළ අලාභයන් අයකර ගැනීමට කටයුතු කරන බැවින් නඩු පැවරීම විෂයෙහි කටයුතු කළ නොහැකි බවට නීතිපතිවරයා විසින් දැනුම්දී ඇති බවට නිරීක්ෂණය විය. කෙසේනමුත් පැමිණිලිකරුට අමතරව අදාළ එන්ජිම අස්ථානගත වීම සම්බන්ධයෙන් වගකිව යුතු බවට පරීක්ෂණ අධිකරණය විසින් තීරණය කළ ඩබ්ලිව්.අයි.ද සිල්වා නිලධාරියා විදේශගතව සිටින බවට අනාවරණය වී ඇති බැවින් ඔහුට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අවශ්‍ය පියවර ගෙන ඇති බවට වගඋත්තර පාර්ශවය විසින් පරීක්ෂණය අවස්ථාවේදී සඳහන් කර ඇත.

පළමු වගඋත්තරකරු වන ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2024.05.30 දිනැති අංක ශ්‍රීලංගුහ/ර.14231/ඕ3 දරණ වාර්තාව අනුව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තිය ප්‍රකාරව යම් විශ්‍රාමික සේවා පුද්ගලයෙකුගේ විශ්‍රාම වැටුප මඟින් රජයට අය කර ගත යුතු අය කිරීම් සම්බන්ධව නීතිමය ප්‍රතිපාදන සලසා ඇති බැවින් එකී විධිවිධාන අනුව කටයුතු කරමින් මෙම පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇති බවට දක්වා ඇත.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තිය අනුව,

> ***"රජයෙන් වැටුප් ලබන තැනැත්තෙක් විශ්‍රාම ලබන අවස්ථාවකදී, එම තැනැත්තාට එරෙහිව යම් විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ සලකා බැලීමට නියමිතව තිබෙනම් සහ එම තැනැත්තා විසින් ලබාදෙන පැහැදිලි කිරීම පිළිබඳව සෑහීමට පත්නොවන්නේ නම් පමණක් එම තැනැත්තාගේ විශ්‍රාම වැටුප, පාරිතෝෂික හෝ වෙනත් දීමනා නතර කිරීමට හෝ යම් මුදලක් අඩු කර ගෙවීම් සිදු කිරීමට තීරණය කළ හැකිය."***

ඒ අනුව, මෙම ප්‍රශ්නගත සිදුවීමේදී පැමිණිලිකරු විශ්‍රාම ලබා ගත් 2015.02.02 දින වන විට පැමිණිලිකරු සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ සලකා බැලීමට නියමිතව තිබී නොමැති අතර, පැමිණිලිකරු විශ්‍රාම ගෙන වසර 5කට පසුව 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අස්ථාන ගත වූ එන්ජිම සම්බන්ධයෙන් පරීක්ෂණ අධිකරණයක් පවත්වා ඇති බවට නිරීක්ෂණය වේ.

<u>*මොහොමඩ් නිස්වර් ඉස්මයිල්*</u> *එදිරිව* <u>*වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු පිරිස*</u> **(SCFR 389/2015)** නඩුවේදී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තියේ යෙදීම සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් පැහැදිලි කර ඇත. ඒ අනුව 12(1) වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තෙකුගේ විශ්‍රාම වැටුප නතර කිරීමට හෝ අඩු කිරීමට හැකි වන්නේ එම තැනැත්තා රජයේ සේවයෙන් විශ්‍රාම ලබාගන්නා අවස්ථාව වන විට ඔහු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ සලකා බැලීමට නියමිතව ඇත්නම් සහ එම තැනැත්තා විසින් ලබාදෙන පැහැදිලි කිරීම සම්බන්ධයෙන් සෑහීමට පත්නොවන්නේ නම් පමණි.

> ***"A pension could be withheld or reduced in terms of Section 12(1) only where***
>
> ***(a) at the time of retirement from the public service, disciplinary proceedings were "pending or contemplated; and***
>
> ***(b) where the explanation offered by the public servant is unsatisfactory."***

ඒ අනුව මෙම නඩුවේ තීන්දුව ලබාදෙමින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය සඳහන් කර ඇත්තේ, පෙත්සම්කරු විශ්‍රාම ලබන විට කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ සලකා බැලීමට නියමිතව තිබූ බවට පෙත්සම්කරු වෙත දැනුම්දීමක් සිදුකර තිබී නොමැති බවත්, පෙත්සම්කරු විශ්‍රාම යාමෙන් පසුව බලධාරීන් විසින් පෙත්සම්කරු සම්බන්ධයෙන් කවර තීරණයක් ගෙන ඇතත් එම තීරණ ගැනීම ප්‍රමාද වී ඇති බවත්, ඒ අනුව පෙත්සම්කරුගේ විශ්‍රාම වැටුප නතර කිරීම අසාධාරණ සහ අත්තනෝමතික තීරණයක් වන බවත් ය. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති නීතිය ඉදිරියේ

සමානාත්මතාවය පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

> ***"In the case in hand there was no disciplinary proceedings pending, and the Petitioner is not bound to explain. State takes up the position that disciplinary proceedings were contemplated in view of letter 1R1. There is absolutely no justification to contemplate such disciplinary proceedings and keep it going for a period of over 6 years and issue a charge sheet which was also served on the Petitioner after about 5 months, after petitioner's retirement from the public service. In the context and circumstances of the case in hand this court takes the view that the Petitioner has been unfairly treated and should not be made to suffer for the lapses on the part of the officials, as stated above."***

උක්ත නඩු තීන්දුවේදී ඉදිරිපත් වූ කරුණු මෙම ප්‍රශ්නගත සිදුවීම සඳහා ද අදාළ කර ගැනීමේ හැකියාව පවතී. ඒ අනුව පැමිණිලිකරු විශ්‍රාම ලබන අවස්ථාව වන විට ආරම්භ කර හෝ සලකා බැලීමට නියමිතව හෝ යම් විනය කටයුත්තක් තිබී නොමැති අතර, ඔහු 2015.02.02 දින විශ්‍රාම ගොස් වසර 5කට පසුව, එනම් 2020 වර්ෂයේදී අස්ථානගත වූ එන්ජිමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පරීක්ෂණ අධිකරණයක් පවත්වා මෙම පැමිණිලිකරු සහ තවත් නිලධාරියෙකු වගකීමට යටත් කර, පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇති බැවින් උක්ත නඩු තීන්දුව ප්‍රකාරව මෙම පැමිණිලිකරු අගතියට පත්ව ඇති බව නිරීක්ෂණය වේ.

තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ 28 වන වගන්තිය ප්‍රකාරව, යම් නිලධරයකුගෙන් හෝ ගුවන් භටයෙකුගෙන් රජයට නැතහොත් සේවා ණය සහන සභාවට හෝ අය විය යුතුව තිබෙන යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණයන් එම නිලධරයා හෝ ගුවන් භටයා වෙනුවෙන් ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුපකින් හෝ පාරිතෝෂිකයකින් අඩුකර ගත හැකි බවට කරුණු දක්වා ඇති නමුත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තියේ විධිවිධාන අභිබවා කටයුතු කිරීමට එමඟින් අවස්ථාව සලසා දී නොමැත. ඒ අනුව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(1) වගන්තිය ප්‍රකාරව යම් නැතැත්තෙක් විශ්‍රාම ලබන අවස්ථාවේදී ආරම්භ කර හෝ සලකා බැලීමට නියමිතව තිබූ විනය කටයුත්තක් මිස විශ්‍රාම යාමෙන් අනතුරුව පරීක්ෂණ සිදු කර රජයට අයවිය යුතු මුදල් අය කර ගැනීමට 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ 28 වන වගන්තිය මඟින් අවස්ථාව සලසා දී නොමැති බවට නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් තීරණය කර ඇති පරිදි සිවිල් අධිකරණයේ නඩු පවරා අදාළ නීතිමය පියවර අනුව කටයුතු කළ යුතුව තිබූ අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු අවහිරතාවයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවේ.

**නිගමනය:**

ඉහත නිරීක්ෂණවලට අනුව, පැමිණිලිකරු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වසර 22ක කාලයක් සේවය කර 2015.02.02 දින විශ්‍රාම යාමෙන් වසර 5කට පසුව එනම් 2020 වර්ෂයේදී ගුවන් හමුදාව තුළ සිදුකළ පරීක්ෂණයක් මඟින් වාහන එන්ජිමක් අස්ථානගත වීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වගකීමට යටත් කර ඔහුගේ විශ්‍රාම වැටුපෙන් පළමුව රු.193,772.82ක මුදලක් සහ දෙවනුව රු.281,227.17ක මුදලක් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම්දීම සහ එකී දැනුම්දීම අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කිරීම තුළින් පළමු සහ දෙවන වගඋත්තරකරුවන් විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

I. පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අයකර ගැනීම වහාම අත්හිටුවීමටත් මේ දක්වා අය කරන ලද මුදල් නැවත පැමිණිලිකරු වෙත ගෙවීමටත් පළමු සහ දෙවන වගඋත්තරකරුවන් පියවර ගත යුතුය.

II. යම් නිලධාරියෙකුගෙන් ආයතනයට අයවිය යුතු අලාභයක් හෝ මුදලක් වේනොත් ඒ සම්බන්ධව පරීක්ෂණ කටයුතු ඔහු විශ්‍රාම යාමට පෙර නීති ප්‍රකාරව ආරම්භ කළ යුතුව පවතින බව අවධාරණය කරන අතර, ඒ අනුව වගඋත්තරකරුවන් විසින් ඉදිරියේදී කටයුතු කළ යුතුය.

2026.04.22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (1) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

(2) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(3) ලේකම්, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

(4) ලේකම්, - කාරුණික දැනගැනීම සඳහා
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.